# සම්පත් පැතිකඩ

# 2021

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

බඩල්කුඹුර

# පෙරවදන

සංවර්ධිත රටවල් හා සම තැන ගන්නට සංවර්ධනය වෙමින් පවතින රටවල් ඉමහත් ප්‍රයත්නයක යෙදී සිටී. සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අත්‍යාවශ්‍ය ප්‍රධානම අංගයක් වන්නේ ප්‍රාදේශීය සංවර්ධනයයි. ප්‍රාදේශීය සංවර්ධනය තුලින් ජාතික සංවර්ධනය තීරණය වේ. ආසියාවේ ආශ්චර්ය කරා ගමන් කරන මෙවන් යුගයක සංවර්ධිත ඉලක්කයන් සපුරා ගැනීමටත් සංවර්ධනය වේගවත් කිරිම හා පුළුල් කිරිමටත් ප්‍රදේශීය සංවර්ධනයට ප්‍රමුඛතාවයක් හිමි වේ.

ශ්‍රී ලංකාවද සංවර්ධනය වෙමින් පවත්නා රටක් බැවින් පෙර සඳහන් සුවිශේෂිතාවය ශ්‍රී ලංකාව තුලද දැකිය හැකිය. ශ්‍රී ලංකාවටද සංවර්ධනය වේගවත් කිරීම හා පුළුල් කිරිම උදෙසා ප්‍රාදේශීය සංවර්ධනයට ප්‍රමුඛතාවය දී කටයුතු කරයි.

මේ සඳහා ප්‍රදේශයේ පවත්නා වූ සම්පත් හඳුනා ගැනීම මූලික කර්තව්‍යයකි. සම්පත් පැතිකඩ වූ කලි ප්‍රදේශයේ පවත්නා වූ භෞතික හා මානව සම්පත් පිළිබඳ තොරතුරු ඒකරාශී කොට අනාගත සංවර්ධනය කාර්යක්ෂම කර ගැනීම උදෙසා සකස් කර ඇති තොරතුරු සංග්‍රහයකි.

ප්‍රාදේශීය සංවර්ධනය කාර්යක්ෂමවත් තිරසාරවත් ලෙස ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රදේශයේ පවතින භෞතික හා මානව සම්පත් සම්පිණ්ඩනය කර මෙම ග්‍රන්ථය තුළින් ඉදිරිපත් කර ඇත. මෙතුළින් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිරි සංවර්ධනයට පිටිවහලක් වෙතැයි අපගේ අභිලාෂයයි.

## ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ......

ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය අනුගමනය කරමින් තිරසාර සංවර්ධනයක් ඇති කිරිමෙහිලා විවිධ වූ ක්‍රමෝපායන් අනුගමනය කිරිමට දරන්නා වූ ප්‍රයත්නයන් අතරින් තවත් එක් සුවිශේෂී ප්‍රයත්නයක් ලෙස ප්‍රදේශයේ පවත්නා වූ මානව හා භෞතික සම්පත් හදුනා ගැනීම පෙන්වා දිය හැකිය.

ඒ අනුව මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය ජනජීවිතය නගා සිටුවීම අරමුණ කරගත් සංවර්ධන ක්‍රියාදාමය උදෙසා සකස් කරන ලද මෙම තොරතුරු සංග්‍රහය තුලින් ආර්ථික ,සමාජ, සංස්කෘතික යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් භෞතික හා මානව සම්පත් පිළිබඳ සැලකිල්ලට ගෙන ප්‍රදේශයේ සංවර්ධනය අභියස පවත්නා ගැටළු හා විභවතා විවරණය කිරීමත් මෙම තොරතුරු සංග්‍රහය තුලින් අපේක්ෂා කෙරේ.

නොයෙක් අඩුපාඩුකම් අවම කරමින් බඩල්කුඹුර ප්‍රදේශය සංවර්ධනය කිරිම සඳහා ගන්නා වූ ප්‍රයත්නයක් මල්ඵල ගැන්වීමක් වශයෙන් කොට්ඨාසයේ සංවර්ධනය විය යුතු අංශයන් හදුනා ගනිමින් සංවර්ධනය වේගවත් කිරිමටත් මෙම පොත පිටුවහලක් වනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි. මෙම පොත සකස් කිරීමට කැප වී ක්‍රියා කළ සංවර්ධන නිලධාරින් ඇතුළු සියලු දෙනාට මාගේ ස්තුතිය පිරිනමමි.

**එන්.ජී.එම්.එස්.කුමාර,**
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

## සහකාර සැලසුම් අධ්‍යක්ෂතුමියගෙන්,

ශ්‍රී ලංකාව ආර්ථික,සාමාජීය හා සංස්කෘතික සංවර්ධනයක් ඇතිකර ගනිමින් යන සංවර්ධන මාවතට අත්වැලක් වෙමින් බඩල්කුඹුර ප්‍රාදේශිකයද ඉටු කරනු ලබන්නේ මහඟු මෙහෙවරකි. මෙම මහඟු මෙහෙවර තවදුරටත් ඔප් නංවාලමින් තීරණ ගනු ලබන විවිධ පාර්ශවයන්ට කොට්ඨාසයට අදාළ මානව හා භෞතික සම්පත් පිළිබඳ තොරතුරු සපයනු ලබනු වස් මෙම ග්‍රන්ථය සම්පාදනය කරනු ලැබිණි.

එම මහඟු කාර්යය ඉටු කිරීමේදී නිරන්තර මහ පෙන්වූ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම්තුමාටත් තොරතුරු සපයා ලමින් සහය වූ කොට්ඨාසයේ සියලුම රාජ්‍ය ආයතන වලටත් වසම් මට්ටමමේ තොරතුරු සැපයූ සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ටත් ග්‍රන්ථය සම්පාදනය කර ගැනීමට වෙහෙස වූ සැලසුම් අංශයේ ආර්ථික සංවර්ධන නිලධාරීන් ඇතුළු සියලු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පළ කරමි.

**කේ.එස් මදූෂානී රංගනී**
සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
බඩල්කුඹුර

## පොත ගැන වදනක් .............

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධිත ඉලක්ක සපුරා ගැනීමෙහි ලා පවතින ගැටලු ජය ගැනීමට විවිධ ක්‍රමඋපායන් අනුගමනය කිරිමට ප්‍රයත්න දරන රටක් ලෙස හදුනා ගත හැකිය. සංවර්ධනය වේගවත් කිරිම උදෙසා ප්‍රධාන වශයෙන් වැදගත් වන ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි මූලික අවධානය යොමු කිරිම මෙහිදී ඉතා වැදගත් වේ.

ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ප්‍රදේශයේ පවත්නා සම්පත් හදුනා ගැනීම මූලික කටයුත්තක් වේ. එනිසා සංවර්ධන නියමුවන් තුල මේ පිළිබඳ පූර්ණ හා නිසි අවබෝධයක් තිබිය යුතුය.

සංවර්ධනයේ අපේක්ෂාවන් ඉටු කිරිම සඳහා ප්‍රාදේශීය සංවර්ධනයේ මුල් පුරුක ලෙස ප්‍රදේශයේ පවත්නා තොරතුරු ඒකරාශි කොට පොතක් ලෙස එළි දැක්වීම මෙමගින් සිදු කර තිබේ. ප්‍රදේශයේ පවතින භෞතික හා මානව සම්පත් හදුනාගෙන ඒවා නිසි ලෙස පෙළ ගස්වා මෙලෙස ඉදිරිපත් කර ඇත.

මේ සඳහා නන් අයුරින් සහයෝගය දැක් වූ රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලුම ආයතන වලටත් විශේෂයෙන්ම මෙම පොත සකස් කිරිමේදි මුල සිටම උපදෙස් සහ අවශ්‍ය සහයෝගය දෙමින් මහ පෙන්වූ ප්‍රාදේශීය ලේකම්තුමාටත්, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමාටත්, සැලසුම් අධ්‍යක්ෂකතුමියටත් තොරතුරු ලබා දීමට සහයෝගය ලබාදුන් සංවර්ධන නිලධාරින් සියලුම දෙනාටත් ග්‍රාම නිලධාරීන් සියලුම දෙනාටත් අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු.

**සංවර්ධන නිලධාරීන්**

සැලසුම් අංශය

# පටුන

පිටුව


1. පොදු තොරතුරු--------------------------------------------------------------------- 1 - 4
2. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම----------------------------------- 5
3. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඓතිහාසික පසුබිම-------------------- 6
4. වාර්ෂික වර්ෂාපතනය සහ උෂ්ණත්වය ------------------------------------------------ 7
5. කොට්ඨාසයේ වසම් පිළිබඳ තොරතුරු -------------------------------------------8 - 15
   5.1. වසම් මට්ටමින් ගම් පිහිටීම----------------------------------------------------8 - 14
   5.2. දිවි නැගුම බැංකු කලාප අනුව වසම් බෙදීම ---------------------------------------15
   5.3. කෘෂිකර්ම උපදේශක කොට්ඨාස අනුව බෙදීම---------------------------------- 15
6. ජනගහන හා රැකීරක්ෂා පිළිබඳ තොරතුරු -------------------------------------- 16 - 31
   6.1. වසම් මට්ටමින් ජනගහනය -----------------------------------------------------17
   6.2. ජාතීන් අනුව ජනගහනය -----------------------------------------------------18-19
   6.3. ජාතින් අනුව පවුල් සංඛ්‍යාව ------------------------------------------------------20
   6.4. ආගම් අනුව ජනගහනය ------------------------------------------------------21-22
   6.5. ආගම් අනුව පවුල් සංඛ්‍යාව------------------------------------------------------ 23
   6.6. වයස අනුව ජනගහනය ---------------------------------------------------- 24 - 25
   6.7. රැකියා නියුක්ති ජනගහනය -------------------------------------------------- 26 - 27
   6.8. අධ්‍යාපනය අනුව ජනගහනය ---------------------------------------------28 – 29
   6.10 ගෘහ මූලික කාන්තාවන් ---------------------------------------------------------30
   6.11 වැන්දඹුභාවය පිළිබඳ තොරතුරු- ------------------------------------------------31
7. ආදායම් පිළිබඳ තොරතුරු--------------------------------------------------------- 32 - 38
   7.1. ජීවනෝපාය මාර්ග (පවුල් වශයෙන්) ---------------------------------------33 – 34
   7.2. මාසික ආදායම(පවුල් වශයෙන්)-------------------------------------------------35
   7.3. මාසික වියදම(පවුල් වශයෙන්)------------------------------------------------ 36
   7.4. වාහන පාරිභෝජනය -------------------------------------------------------- 37 - 38
8. යටිතල පහසුකම් පිළිබඳ තොරතුරු ------------------------------------------- 39 - 50
   8.1. නිවාස තත්ත්වයන් (ප්‍රමාණාත්මකව)-------------------------------------------40 – 41
   8.2. නිවාස සංඛ්‍යාව (පවුල් වශයෙන්)---------------------------------------------------42
   8.3. පානීය ජල පහසුකම් (පවුල් වශයෙන්) -------------------------------------43 – 44
   8.4. පානීය ජල පහසුකම්(ප්‍රමාණාත්මකව)-------------------------------------------45
   8.5. සනීපාරක්ෂක පහසුකම් (පවුල් වශයෙන්)----------------------------------46 – 47
   8.6. සනීපාරක්ෂක පහසුකම් භාවිතය----------------------------------------------------48
   8.7. බලශක්ති පරිභෝජනය (පවුල් වශයෙන්) -------------------------------- 49 - 50

9. කොට්ඨාසයේ ඉඩම් තොරතුරු ------------------------------------------------ 51 - 63
9.1. වසම් අනුව භූමි ප්‍රමාණය ----------------------------------------------------52
9.2. ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු ---------------------------------------------- 53 - 54
9.3. ඉඩම් පරිහරණය (අක්කර) ------------------------------------------------ 55 - 56
9.4. ඉඩම් පරිභෝජනය------------------------------------------------------- 57 - 58
9.5. ස්වභාවික සම්පත් පිහිටීම----------------------------------------------- 59 - 60
9.6. සංචාරක වශයෙන් වැදගත් ස්ථාන -----------------------------------------61
9.7. සුසාන භූමි පිළිබඳ තොරතුරු-------------------------------------------- 62 - 63
10. සමාජ සේවා කටයුතු හා ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ තොරතුරු ----------64 – 75
10.1 සමාජ සේවා සැලසීම--------------------------------------------------------- 65
10.2 වැඩිහිටි දීමනා ගෙවීම්-------------------------------------------------------65
10.3 මහජන ආධාර ගෙවීම්--------------------------------------------------------66
10.4 රෝගාධාර ගෙවීම---------------------------------------------------------66 - 67
10.5 ආබාධ සහිත පුද්ගලයන්-----------------------------------------------68 -74
10.6 විශේෂ කුසලතා සහිත පුද්ගලයන්---------------------------------------75 -76
11. අධ්‍යාපන තොරතුරු ------------------------------------------------------------- 77 - 85
11.1 පාසල් පිළිබඳ තොරතුරු--------------------------------------------------- 78 - 79
11.2 පෙර පාසල් පිළිබඳ තොරතුරු ------------------------------------------- 80 - 82
11.3 දහම් පාසල් පිළිබඳ තොරතුරු------------------------------------------ 83- 84
11.4 කලායතන පිළිබඳ තොරතුරු------------------------------------------------85
12. කොට්ඨාසයේ සෞඛ්‍ය හා පෝෂණ මට්ටම් පිළිබද තොරතුරු -----------------86 – 89
13. 12.1 කොට්ඨාසයේ රෝහල් පිළිබඳ තොරතුරු- ------------------------------------89
14. සත්ව පාලන කටයුතු ------------------------------------------------------------ 90 - 92
13.1 පශු සම්පත් පිළිබඳ තොරතුරු------------------------------------------- 90 - 92
15. කෘෂි කාර්මික තොරතුරු ------------------------------------------------------93 - 101
14.1 කෘෂි කාර්මික බෝග පිළිබඳ තොරතුරු ------------------------------------------93
14.2 කෘෂි කාර්මික තොරතුරු (හිඟුරුකඩුව කලාපය)-------------------------- 93 - 97
14.3 කෘෂි කාර්මික තොරතුරු (බඩල්කුඹුර කලාපය)-------------------------98 - 101
16. කර්මාන්ත පිළිබඳ තොරතුරු--------------------------------------------- 102 -111
15.1 මූල්‍ය හා වෙළඳ සේවා කටයුතු----------------------------------------------- 102
15.2 දිවිනැගුම බැංකු සංගම් පිළිබඳ තොරතුරු ------------------------------- 102 - 103
15.3 ගෘහස්ත කර්මාන්තවල නියුතු පුද්ගලයින් ------------------------------- 104 - 109
17. ස්වේච්ඡා සංවිධාන පිළිබඳ තොරතුරු --------------------------------------- 110 - 131
18. ආගමික ස්ථාන හා පොදු ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ------------------- 132 - 140

17.1 ආගමික ස්ථාන ---------------------------------------------------------- 132– 134

17.2 පොදු ගොඩනැගිලි -------------------------------------------------------135 – 138

17.3 නළ ළිං පිළිබඳ තොරතුරු-----------------------------------------------139 - 140

19. වතු නිවාස ආශ්‍රිත තොරතුරු --------------------------------------------------- 141 - 143

18.1 වතු ජනගහනය--------------------------------------------------------------------- 141

18.2 වතු නිවාස ---------------------------------------------------------------------------- 142

18.3 වතු සනීපාරක්ෂක පහසුකම්--------------------------------------------------- 143

20. කොට්ඨාසයේ රණවිරුවන් පිළිබඳ තොරතුරු ---------------------------------- 144 - 148

21. බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන තොරතුරු ---------149 – 167

21.1 සංවර්ධන වැඩසටහන් සාරාංශය ----------------------------------149 – 150

21.2 ගම්පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන-------------------- 151 - 156

21.3. විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන ------------------------------157 - 160

21.4 ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන ------------------------------------------ 161

21.5 ඌව වෙල්ලස්ස සංවර්ධන වැඩසටහන ---------------------- ---------------- 161

21.6 කඳුරට නව ගම්මාන සංවර්ධනය වැඩසටහන----------------------------------162

21.7 කන්ද උඩරට උරුමය ආරක්ෂා කිරීමේ හා සංවර්ධනය කිරීමේ වැඩසටහන162

21.5.දිවිසර ප්‍රජාඵලදායිතා වැඩසටහන----------------------------------------------163

21.6.වතු මාර්ග සංවර්ධන වැඩසටහන-----------------------------------------------164

21.7 සුබිතපුරවර කුඩා නගර සංවර්ධන වැඩසටහන --------------------------------164

21.8 කෘෂි ළිං ඉදි කිරීම-------------------------------------------------------------------165

21.6. පළාත් සභා වැඩසටහන------------------------------------------------166 - 167